www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ආතතීන් ඉහල නගිද්දී පකිස්තානය ඉන්දියානු දේශසීමාවට හටයින් යවයි

## Amid rising tensions, Pakistan moves troops to Indian border

**කේ. රත්නායක විසිනි**
**2008 දෙසැම්බර් 29**

පකිස්තාන මිලිටරිය පසුගිය සිකුරාදා සිය ඉන්දියානු දේශසීමාවේ පදනම් ශක්තිමත් කරගනු වස් බටහිරින් ඇති ඇෆ්ඝනිස්ථාන දේශසීමාවෙන් හටකායන් මාරුකර යැවීම ඇරඹීමත් සමග ඉන්දියාව සහ පකිස්තානය අතර ආතතීන් ගැඹුරු විය. රටවල් දෙක ම යුද අන්තරාය නො සලකා හරිතත් ආන්ඩු දෙක ම සම්මුතියකට කිසිදු කැමැත්තක් පෙන්වා නැති අතර මිලිටරිමය ක්‍රියාවක හැකියාව ප්‍රතික්ෂේප කොට ද නැත.

170 දෙනෙකුට වැඩි ගනනකට මරු කැඳවමින් පසුගිය මාසයේ සිදු වූ මුම්බායි ත්‍රස්තවාදී ම්ලේච්ඡ ක්‍රියාවට වගකිව යුතු යයි චෝදිත පකිස්තානයේ පදනම් ඇති ඉස්ලාමීය සංවිධානවලට එරෙහිව පියවර ගන්නා ලෙසට නව දිල්ලිය නොකඩවා ඉස්ලාමාබාදයට බල කොට ඇත. මෙම මස මුල දී පකිස්තාන අධිකාරීහු ලෂ්කාර්-ඊ-ටයිබා සංවිධානයේ නායකයන් කිහිප දෙනෙකු රඳවා ගත් අතර ජමාට්-උඩ්-ඩාවා නම් ඉස්ලාමීය ආධාර සංවිධානය මත කඩා පැන්නාහ.

පකිස්තානය තුල ඇති "ත්‍රස්තවාදී පුහුනු කඳවුරු" මතට ප්‍රහාර එල්ල කරන ලෙස මාධ්‍යවලින් සහ විරුද්ධ පක්ෂවලින් නොකඩවා කෙරෙන ආයාචනා කිරීම් මධ්‍යයේ මිලිටරිමය විකල්පය ද ඇතුලත්ව සියලු විකල්ප විවෘතව ඇති බව ඉන්දියානු ආන්ඩුව යලි යලිත් තහවුරු කොට ඇත.

පකිස්තාන හටකායන් ප්‍රති-ස්ථානගත කිරීම පිලිබඳ විස්තර සීමිත ය. ඇෆ්ඝන් දේශසීමා ආශ්‍රිත ප්‍රදේශවලින් හටයන් 20,000ක් දක්වා වන ගනනක් ඉවත් කර ගනු ලැබ ඇතියි ඇසෝෂියේටඩ් ප්‍රෙස් වාර්තා කල ද නම සඳහන් නො කල පකිස්තාන නිලධාරියෙක් වොෂින්ටන් පෝස්ට් වෙත පවසා ඇත්තේ හටයන් 5,000 කට වැඩියෙන් යෙදවෙනු නැති බවයි. " දේශසීමාවේ ඉන්දියානු හටයන් බොහෝ ගනනක් යෙදවෙද්දී අපගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය අවම පියවර අපි ගනිමින් සිටිනවා" යයි ඔහු කීවේ ය.

"යලි හටයන් යැවීම ලබන සතියේ මුල වනවිට පකිස්තානය තුලට ඉන්දියානු ප්‍රහාරයක් එල්ල වෙතැයි යනුවෙන් ලැබී ඇති නව රහස් තොරතුරකට පාර්ශවිය ප්‍රතිචාරයක්" යනුවෙන් පකිස්තාන නිලධාරියෙක් පැවසී යයි නිව් යෝර්ක් ටයිම්ස් පුවත්පත උපුටා දැක්වීය. සුවිශේෂී ආරක්ෂක ස්ථාන සහ නගර ආරක්ෂා කිරීමට පකිස්තාන ගුවන් හමුදාව ඉහල ම අවධානයෙන් පසුවන බව එක් නිලධාරියෙක් පුවත්පතට කීවේ ය. ගුවන් නියමුවන් නිල ඇඳුම පිටින් සපත්තු ලා ගෙන නින්දට යන බව ඔහු කියා සිටියේ ය.

සිය බිරිඳ වන බෙනාසීර් භූතෝගේ ඝාතනයේ පලමු සංවත්සරය සැමරීමට එක්වූ පිරිසක් ඇමතූ ජනාධිපති අසීෆ් අලි සර්දාරි පකිස්තානයට අවශ්‍ය යුද්ධය නොව සාකච්ඡාවක් යයි පැවසී ය. රටවල් දෙක තුල ම ත්‍රස්තවාදී ප්‍රහාර එල්ල කිරීම පිලිබඳ ව " රාජ්‍ය නො වන රඟන්නන්ට" ඔහු දොස් පැවරී ය. කෙසේ වෙතත් සිය භූමිය එල්ල වන කිසිදු ඉන්දීය ප්‍රහාරයක් නො ඉවසන බව ඉස්ලාමාබාදය අවධාරනය කරයි. "එවැන්නක් සිදු වුවහොත් එයට ප්‍රතිචාර දැක්වීමට අපට බල කෙරෙනු ඇත" යි විදේශ ඇමති ෂා මෙහ්මුද් කුරේෂි රාජ්‍ය පුවත් ඒජන්සියට පැවසී ය.

පකිස්තානය තුල "යුද හිස්ටීරියාවක්" නිර්මානය වෙමින් තිබීම අවාසනාවන්ත තත්වයක් බව ඉන්දීය විදේශ ඇමති සෙනසුරාදා ප්‍රකාශ කලේ ය. "සැබෑ කරුනින් ඉවත නො හැරී ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීමටත් මුම්බායි ප්‍රහාරය කල අපරාධ කරුවන් නීතිය හමුවට ගෙන ඒමටත් ඔවුන් අවධානය යොමු කල යුතු ය" යයි ඔහු කීවේ ය. එහෙත් පසුගිය සතිය පුරා ඉන්දීය ආන්ඩුව පකිස්තානය මත පීඩනය භ්‍රමනය කරමින් සිටියේ ය.

මුම්බායි ප්‍රහාරකයන්ගෙන් ඉතිරිව සිටින එකම තැනැත්තා වන අජ්මාල් කසාබ් විසින් පකිස්තානයෙන් නෛතික උපකාර ඉල්ලා ලියන ලද ලිපියක් පසුගිය

සඳුදා ඉන්දීය විදේශ අමාත්‍යාංශය විසින් භාරදෙනු ලැබී ය. එම පියවර සැලසුම් කරන ලද්දේ කසාබ් පකිස්තාන ජාතිකයෙක් බව තහවුරු කිරීමට හා පකිස්තාන ඉස්ලාමීය සංවිධානයන් මර්දනය කරන ලෙස ඉන්දියාව කරන ඉල්ලීම් නීත්‍යානුකූල කිරීමට ය. කසාබ් පකිස්තාන ජාතිකයෙකු බවට පවතින සියලු සාක්ෂි ඉස්ලාමාබාදය මේ දක්වා ප්‍රතික්ෂේප කොට තිබේ.

"ඕනෑම ආකාරයක මිලිටරිමය ගැටුමක් ඇති වුව හොත් කවුරුවත් එය මාධ්‍ය හරහා ප්‍රකාශ කරන්නේ නැහැ. අපි සියලු විකල්ප විවෘතව තබා ඇත. අපේ මිනිසුන් මරුමුවට පත් වී තිබෙන නිසා අපි කිසිදු විකල්පයක් නො තකා හරින්නේ නැහැ" යයි ඉන්දීය රාජ්‍ය තාන්ත්‍රිකයන්ට උපදෙස් දෙමින් මුකර්ජි පැවසී ය.

තත්වය විමර්ශනය කිරීම සඳහා පසුගිය සිකුරාදා ඉන්දීය අගමැති මන්මෝහන් සිං ඉන්දීය ආරක්ෂක හමුදා ප්‍රධානීන් හමු විය. *ටයිම්ස් ඔෆ් ඉන්දියා* පුවත්පත සෙනසුරාදා වාර්තා කලේ ඉන්දියාවේ දෙවන සහ දසවන බලකායන් පන්ජාබය වෙත ස්ථාන ගත කරනු ලැබ ඇති බව යි. මෙම ස්ථාන ගත කිරීම් පකිස්තානය කරන දෙයට ප්‍රතිචාරයක් නොව සුපුරුදු වාර්ෂික අභ්‍යාසයන් යයි ඉන්දීය මිලිටරි ප්‍රකාශක සිතාන්සු කාර් අවධාරනය කලේ ය. එහෙත් පවත්නා දේශපාලන වාතාවරනය යටතේ ඕනෑ ම හටකා චලනයක් සැකය වැඩිකරමින් ආතතීන් ඉහල දමයි.

සෙනසුරාදා ම ද ගාඩියන් ඉන්දියාවේ බටහිර ගුවන් බලකා ප්‍රධානී එයාර් මාර්ෂල් පී.කේ. බාබෝරා උපුටා දක්වමින් වාර්තා කලේ ගුවන් හමුදාව පකිස්තාන භූමි ප්‍රදේශය තුල "ත්‍රස්තවාදී" ඉලක්ක 5,000 ක් හඳුනා ගෙන ඇති බව යි. රාජ්‍ය තාන්ත්‍රිකත්වයට අවස්ථාවක් දිය යුතු බවත් එහෙත් එය අසමර්ථ වුව හොත් " අවසන් තෝරා ගැනීම වන්නේ යුද්ධය" බවත් ඔහු කීවේ ය.

එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, ඉරානය සහ චීනය න්‍යෂ්ටික ආයුධවලින් සන්නද්ධ බලයන් දෙක අතර ආතතීන් සමහන් කිරීම සඳහා ප්‍රසිද්ධියේ ආයාචනා කොට ඇත. 1947 දී නිදහස ලද තැන් පටන් මේ දක්වා ඉන්දියාව හා පකිස්තානය යුද්ධ තුනක නිරතව ඇති අතර නව දිල්ලි නුවර ඉන්දියානු පාර්ලිමේන්තුවට එල්ල වූ ප්‍රහාරයකින් අනතුරුව 2001-02 සමයේ දී හතරවන යුද්ධයක් අද්දරට ම පැමිනුනි.

අනවශ්‍ය ආතතීන් ඉහල දමන පියවරයන් වැලැක්වීමට කටයුතු කරන ලෙස ධවල මන්දිර ප්‍රකාශක ගෝඩන් ජෝන්ඩ්‍රෝ සිකුරාදා දෙරටට ම ආයාචනා කලේ ය. තම සගයන් දෙදෙනා අතර ගැටුමක් වැලැක්වීමේ අවශ්‍යතාව තිබෙන අතර ම පකිස්තානය තුල පිහිටි කඳවුරුවල සිට ක්‍රියාත්මක වන එක්සත් ජනපද විරෝධී කැරලිකරුවන්ට එරෙහිව මිලිටරි ක්‍රියාන්විත උත්සන්න කරන ලෙස එක්සත් ජනපදය පකිස්තානයට බලකරමින් සිටී. ඒ අතර ම ඉස්ලාමීය කන්ඩායම්වලට එරෙහිව තදබල ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසට ඉන්දියාව කරන බලපෑම්වලට ප්‍රතිචාර දක්වන ලෙස ද වොෂිංටනය ඉස්ලාමාබාදයට පීඩනය යොදමින් සිටී.

කෙසේ වෙතත් ඉන්දියාව සහ පකිස්තානය නරක්වන ආර්ථික අර්බුදයකට හා වැඩෙන සමාජ අතෘප්තියකට මුහුන දෙමින් සිටිති. පුරුද්දක් ලෙස ම වාර්ගික අනන්‍යතා සූදුවේ යෙදී ඇති දෙරටේ ම පාලක ප්‍රභූහු තම ස්වදේශික ප්‍රතිපත්තිවල අසමත් බවින් අවධානය ඉවතට යොමු කිරීමේ උපක්‍රමයක් ලෙස එකිනෙකා වරද පටවා ඇත.

පසුගිය වර්ෂ තුන පුරා පැවති සියයට 9ක දල ජාතික නිෂ්පාදන වර්ධන රේට්ටුව මේ වසරේ සියයට 7ක් දක්වා පහත බැස ඇති බව පසුගිය සතියේ ඉන්දියානු ආන්ඩුව නිවේදනය කලේ ය. අගෝස්තු සිට ඔක්තෝබර් දක්වා මාස තුන තුල පමනක් සමාගම් විසින් කම්කරුවන් 65,500ක් දොට්ට දමා ඇතිබව ආන්ඩුවේ සමීක්ෂනයක් සටහන් කලේ ය. අනවරතව ඉහල නගින ඉහල දිවිනසා ගැනීම් - පසුගිය වසරේ එය 16,662 කි - ග්‍රාමීය ප්‍රදේශවල ආර්ථික විනාශය පිලිබිඹු කරනු ලබයි.

නව රුදුරු ත්‍රස්ත-විරෝධී නීති පනවමින් ද පකිස්තානය මත යොදන පීඩනය වැඩි කරමින් ද කොංග්‍රස්-නීත ආන්ඩුව මුම්බායි ත්‍රස්ත ප්‍රහාරයට ප්‍රතිචාර දක්වා ඇත. ලබන වසරේ ජාතික මැතිවරන පැවැත්වීමට නියමිත තතු යටතේ අගමැති මන්මෝහන් සිං හින්දු අධිපතිවාදී භාරතීය පක්ෂය (බීජේපී) වෙතින් එල්ල වන ඕනෑම විවේචනයක් වැලැක්වීමේ මං සොයමින් සිටී. බීජේපීය පසුගිය සතියේ ආන්ඩුව පකිස්තානයට එරෙහිව ගත් පියවරයන්ට සහාය දුන් අතර ම ඉස්ලාමාබාදයට "ශක්තිමත් පනිවුඩයක්" යවන ලෙස, එනම් මිලිටරිමය ක්‍රියාවක් සඳහා නො සැඟවුනු ඉල්ලීමක් කලේ ය.

පකිස්තානය ඉන්දියාවට වඩා නරක ආර්ථික තත්වයකට මුහුන දී සිටී. භව්‍ය බිඳවැටීමක් වැලැක්වීමට එරට ආන්ඩුව මෑතක දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජාමුඅ) වෙතින් නයක් ලබාගැනීමේ උත්සාහයක යෙදුනි. ජාමුඅහි කප්පාදු පියවරවල් කරනු ඇත්තේ දැනට මත් මිලියන ගනනකට බලපාන ප්‍රගාඪ සමාජ අර්බුදයක් තවදුර උත්සන්න කිරීම පමනි.

පකිස්තාන ජනාධිපති සර්දාරි වඩ වඩා කොන්වෙමින් සිටී. දේශපාලනිකව සහ ආර්ථිකව වොෂිංටනය මත රැඳෙන ඔහු ඇෆ්ඝනිස්ථාන දේශසීමා

ප්‍රදේශවල මිලිටරිමය ක්‍රියාමාර්ගයකට යෙදෙන ලෙස එක්සත් ජනපදයෙන් පීඩනයට අනුගත වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස ඉස්ලාමීය කන්ඩායම් මත කඩා පතිත ලෙස ප්‍රතිමල්ලව ඉන්දියාවෙන් කෙරෙන ඉල්ලීම්වලට ක්ෂනිකව හිස නො නැමීම මගින් තමන් ඇමරිකානු ගැත්තෙකු ය යන විවේචනයන් අපගමනය කිරීමේ බලවත් ඕනෑකමින් ඔහු පසු වේ.

මේ අවධියේ දෙරට තව මත් තම සාමකාමී අභිප්‍රායන් ප්‍රකාශ කරමින් සිටිති. එහෙත් ආතතීන් අනවරතව ඉහල නගිද්දී ඉන්දියාව තුල සිදු කෙරෙන තවත් ත්‍රස්ත ප්‍රහාරයක්, දේශසීමා ගැටුමක් හෝ පකිස්තානය තුලට කෙරෙන ඉන්දියානු ගුවන් ප්‍රහාරයක් ආදී ඕනෑ ම සිද්ධියක් යුද්ධයක් කරා වේගයෙන් පුපුරා හැලීමක් මුදාහැරීමේ විභවයක් පවතී.

© www.wsws.org